# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2108/4 – 2019 ජනවාරි 28 වැනි සඳුදා – 2019.01.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: සාගි/පෞද්/01/2017.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

එක් පාර්ශවයක් වශයෙන් කුරුණෑගල, දඹුල්ල පාර, අංක 80 හි පිහිටි කුරුණෑගල වැවිලි සමාගම සහ අනෙක් පාර්ශවය වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/09 හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය අතර 2017.09.25 දින ඇති කර ගන්නා ලදුව, අංක 2076/5 හා 2018.06.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද 2017 අංක 37, 38 හ 39 දරන සාමුහික ගිවිසුම් අවලංගු කරන ලෙසට අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති විසින් කාර්මික ආරාවුල් පනතේ 9(2) ආ වගන්තිය යටතේ අවලංගු කිරීමේ නිවේදනයක් මා වෙත එවා ඇත.

131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 9(2) ආ වගන්තිය ප්‍රකාරව 2017 අංක 37, 38 හා 39 දරන සාමුහික ගිවිසුම් ක්‍රියාත්මක වීම 2018 නොවැම්බර් මස 30 දින සිට අවසන් වන බවට තවදුරටත් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජනවාරි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

1A – G 29332 – 15 (2019/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2018.10.15.

කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත මහතා,
කම්කරු කොමසාරිස් - කාර්මික සම්බන්ධතා අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව,
නාරාහේන්පිට,
කොළඹ 05.

මහත්මයාණෙනි,

**පළමුවන උපලේඛනය**

'අ' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**
**සාමුහික ගිවිසුමක් / බේරුම්කරුවකුගේ කම්කරු විනිශ්චය අධිකාරයක නිරවුල් කිරීමක්**
**තීරණයක් / ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

2018.06.18 දින අංක 2076/5 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද කුරුණෑගල වැවිලි සමාගම සහ අන්තර් සමාගම් සේවක සංගමය බැඳී සිටින්නා වූ ද 2017 අංක 37, 38 හා 39 දරන සාමුහික ගිවිසුම් ප්‍රතික්ෂේප කරන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

ස්තුතියි,
මෙයට,

වසන්ත සමරසිංහ
සභාපති,
අන්තර් සමාගම් සේවක සංගමය.

පිටපත - සභාපති, කුරුණෑගල වැවිලි සමාගම.

02 - 400

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.